# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 9 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 නොවැම්බර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1972 දෙසැම්බර් මස 08 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 9 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 නොවැම්බර් මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 19/72.

ඉඩම්වලට බලපාන ආරවුල් ලඝු ලෙස විභාග කොට නිරවුල් කිරීමට මහෙස්ත්‍රාත්වරුන්ට හැකිකම ලබාදීම පිණිස ද; අත්හිටවූ දණ්ඩන නියම ක්‍රමයක් ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂ ධුරයක් පිහිටුවීමට හැකි කරවීම පිණිස හා ඒ අධ්‍යක්ෂගේ බලතල හා යුතුකම් නිරූපණය කිරීම පිණිස ද; ඒ කාර්යයන් සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි. 20 වන අධිකාරය, I වන කාණ්ඩය, 434 වන පිටුව.

ශ්‍රී ලංකා ජන රජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. (1) මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 9 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි දිනයක හෝ දිනයන්හි මේ පනත එහි විධිවිධාන සියල්ල ම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 20 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "දිසා විනිශ්චයකරු" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්:—

'"පුපුරණ ද්‍රව්‍ය" යන්නට පුපුරණ ද්‍රව්‍ය පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත;';

(ආ) "වරද" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්:—

'"පීඩාකර ආයුධය" යන්නට 1966 අංක 18 දරන පීඩාකර ආයුධ පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත;'; තව ද

(ඇ) "ශ්‍රේෂ්ඨාධිකරණය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්:—

'"අත්හිටවූ දණ්ඩන නියමය" යන්නෙන්, 324අ වන වගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන්නේ යම් දණ්ඩන නියමයක් සම්බන්ධයෙන් ද ඒ දණ්ඩන නියමය අදහස් වේ;'.

කේ—14498 10,919 (11/72)

VIIඅ වන අලුත් පරිච්ඡේදය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදයට ඉක්බිතිව ම, පහත සඳහන් අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුලත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ VIIඅ වන පරිච්ඡේදය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

'VIIඅ වන පරිච්ඡේදය

ඉඩම්වලට බලපාන ආරාවුල් පිළිබඳ විභාග

ඉඩම්වලට බල පාන ආරාවුල් පිළිබඳ විභාග.

98අ. (1) යම් පොලිස් නිලධරයකු විසින් සපයන ලද තොරතුරක් අනුව හෝ අන් ලෙසකින් සවකිය ප්‍රාදේශිය අධිකරණ බල සීමා තුළ පිහිටි යම් ඉඩම කට බල පාන ආරාවුලක් පැවතීම හේතුකොට ගෙන සාමය කඩ වීමක් සිදු වීමට ඉඩ ඇතැයි විශ්වාස කිරීමට මහේස්ත්‍රාත්වරයකුට හේතු තිබෙන කවර විටෙක වුව ද,—

(අ) ඒ ආරාවුල පිළිබඳ ව විභාගයක් පැවැත්වීම සඳහා දිනයක් නියම කරමින් ද ;

(ආ) ඒ විභාගයට පැමිණ සිටින ලෙසත්, ආරාවුලට හේතු වූ ඉඩමෙහි හෝ ඉඩම් කොටසෙහි නියම භුක්තිය සහ ඒ ආරාවුල විෂය වූ යම් අයිතිවාසිකමක් පිළිබඳ ඔහුගේ හිමිකම් දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් එසේ නියම කරනු ලැබූ දින යෙහි හෝ ඉන් පෙර අධිකරණයට ඉදිරි පත් කරන ලෙසත් ඒ ආරාවුලට සම්බන්ධ සෑම තැනැත්තකුට ම නියම කරමින් ද

ඒ මහේස්ත්‍රාත්වරයා විසින් දැන්වීමක් නිකුත් කළ හැකි ය.

(2) ඒ දැන්වීමේ පිටපතක්, සිතාසි භාර දීම සඳහා මේ සංග්‍රහයෙන් විධිවිධාන සලස්වා තිබෙන ආකාරයට මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබිය හැකි තැනැත්තා හෝ තැනැත්තන් වෙත භාර දිය යුතු අතර, ඒ දැන්වීමේ යටත් පිරිසෙයින් එක් පිටපතක් ආරාවුල විෂය වූ ඉඩමෙහි හෝ ඒ අසල යම් පැහැදිලිව පෙනෙන ස්ථානයක ඇලවිය යුතුය. දැන්වීමෙහි පිටපතක් එසේ අලවනු ලැබූ අවස්ථාවක, යම් පාර්ශ්වකරුවකු වෙත ඒ දැන්වීම භාර දී නොමැති විය හැකි බව නොතකා මේ පරිච්ඡේදය යටතේ විභාගයක් පවත්වනු ලැබිය හැකි අතර මේ පරිච්ඡේදය යටතේ යම් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

විභාගය ලබු ලෙස පැවැත්විය යුතු බව.

98ආ. (1) මේ පරිච්ඡේදය යටතේ වූ සෑම විභාගයක් ම 98අ වන වගන්තිය යටතේ නියම කරනු ලැබූ දිනයෙහි නැතහොත් මහෙස්ත්‍රාත්වරයා විසින් විභාගය අඛාල ව කල් තබනු ලැබිය හැකි වූ වෙනත් දිනයක හෝ දිනයන්හි ලඝු ලෙස පැවැත්විය හැකි ය.

(2) විභාගය අවසානයේදී කරනු ලබන ආඥාවක සලස්වනු ලැබීමට මේ පරිච්ඡේදය යටතේ මහෙස්ත්‍රාත්වරයාට බලය දී ඇති යම් විධිවිධානයක් අඩංගු අතුරු ආඥාවක් ඒ විභාගය අවසාන කිරීමට පෙර ඔහු විසින් කළ හැකි ය.

මහෙස්ත්‍රාත්වරයාගේ නිශ්චය කිරීම හා ආඥාව.

98ඇ. (1) ආරාවුල යම් ඉඩමක් හෝ ඉඩමක යම් කොටසක් භුක්ති විඳීමේ අයිතිවාසිකමට සම්බන්ධ බව ද ඒ ආරාවුල සාමය කඩවීමකට තුඩු දිය හැකි බව ද ඒ විභාගයේදී පෙනී යන අවස්ථාවක, 98අ වන වගන්තිය යටතේ වූ දැන්වීම නිකුත් කිරීමේ දිනයෙහි ඒ ආරාවුලට හේතු වූ ඉඩමේ හෝ කොටසේ භුක්තිය දරමින් සිටියේ කවරකු ද යන බව නිශ්චය කිරීම ඒ විභාගය පවත්වන මහෙස්ත්‍රාත්වරයාගේ යුතුකම විය යුතු ය. ඔහු මේ වගන්තිය යටතේ නිශ්චයක් කරන අවස්ථාවක, (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වෙතොත් මිස ඔහු විසින් (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් කළ හැකි ය.

(2) මේ උපවගන්තිය යටතේ වූ ආඥාවකින්, ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් යම් එක් තැනැත්තකුට හෝ තැනැත්තන් වැඩි දෙනකුට, ඒ තැනැත්තා හෝ තැනැත්තන් ආරාවුලෙහි විෂය වූ ඉඩමෙන් හෝ ඉඩමේ කොටසින් නිසි අධිකරණයක විනිශ්චයක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් යටතේ නෙරපනු ලබන තුරු එම ආඥාවෙහි නිශ්චිතව සඳහන් ආකාරයට ඒ ඉඩමෙහි හෝ කොටසෙහි භුක්තියට හිමිකම් ඇති බව ප්‍රකාශ විය යුතු අතර, නිසි අධිකරණයේ එවැනි ආඥාවක හෝ තීන්දු ප්‍රකාශයක බලය යටතේ නොවන ආකාරයකින් විය හැකි ඒ භුක්තිය පිළිබඳ වූ සියලු බාධා කිරීම් ඉන් තහනම් විය යුතු ය.

(3) යම් ඉඩමක් හෝ ඉඩමක යම් කොටසක් භුක්ති විඳීමේ අයිතිවාසිකමට සම්බන්ධ ආරාවුලක් පිළිබඳ විභාගයකදී ඒ ඉඩමේ හෝ කොටසේ භුක්තිය දැරූ යම් තැනැත්තකු 98අ වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමෙහි දිනයට පෙරාතුව ම වූ මාස දෙකක කාලය ඇතුළත බලහත්කාරයෙන් භුක්තියෙන් පහ කරනු ලැබූ බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඒ බවට ඔහු විසින් නිශ්චයක් කොට (4) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් කළ හැකි ය.

(4) (2) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක එම උපවගන්තියෙහි සඳහන් ප්‍රකාශයට හා තහනමට අතිරේක ව, ආඥාවෙහි නිශ්චිත ව සඳහන් යම් පාර්ශ්වකරුවකු ඒ ආඥාවෙහි නිශ්චිත ව සඳහන් ඉඩමේ හෝ එහි යම් කොටසක භුක්තියට නැවත පත් කළ යුතු බවට විධානයක් ඇතුළත් විය හැකි ය.

(5) යම් ඉඩමක හෝ ඉඩමක යම් කොටසක භුක්තියට ඇති අයිතිවාසිකම නොවන, ඒ ඉඩමෙහි හෝ එහි ඒ කොටසෙහි යම් අයිතිවාසිකමකට ආරාවුල සම්බන්ධ අවස්ථාවක, ආරාවුලෙහි විෂය වූ අයිතිවාසිකමට හිමිකම් ඇත්තා කවරකු ද යන්න මහෙස්ත්‍රාත්වරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර ඔහු විසින් (6) වන උපවගන්තිය යටතේ ආඥාවක් කළ යුතු ය.

(6) මේ උපවගන්තිය යටතේ වූ ආඥාවකින්, ඉඩමෙහි හෝ ඉඩමෙහි යම් කොටසක, නැතහොත් ඒ පිළිබඳ වූ, එම ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් අයිතිවාසිකමකට එම ආඥාවෙහි නිශ්චිතව සඳහන් යම් තැනැත්තකු, ඒ තැනැත්තා නිසි අධිකරණයක විනිශ්චයක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් ප්‍රකාර එම අයිතිවාසිකම අහිමි වන තුරු, හිමිකම් ලැබිය යුතු බව ප්‍රකාශ විය හැකි අතර ඉහත කී පරිදි විනිශ්චයක, ආඥාවක හෝ තීන්දු ප්‍රකාශයක බලය යටතේ හැර ඒ පාර්ශ්වකරුගේ ඒ අයිතිවාසිකම ක්‍රියාවෙහි යෙදවීම පිළිබඳ සියලු බාධා කිරීම් හෝ අයුතු මැදිහත් වීම් ඉන් තහනම් කළ හැකි ය. ඒ අයිතිවාසිකම ක්‍රියාවෙහි යෙදවීම හෝ ඒ ඉඩමේ හෝ ඉඩමේ කොටසේ යම් අස්වැන්නක් හෝ පලදාවක් විකිණීම හෝ ඒ අස්වැන්න හෝ පලදාව විකිණීමෙන් ලැබෙන මුදල් පිළිබඳ භාරය හෝ ඒ මුදල් ගැන ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ව මහෙස්ත්‍රාත්වරයා සුදුසු යැයි අදහස් කරන වෙන යම් විධානයන් ද ඒ ආඥාවෙහි ඇතුළත් විය හැකි ය.

(7) මේ වගන්තිය යටතේ වූ නිශ්චයක් කිරීම 98අ වන වගන්තිය යටතේ කරන ලද දැන්වීමට අනුකූල ව සපයන ලද ප්‍රකාශ වෙතොත් ඒවා ද ස්වකීය අභිමතය පරිදි මහෙස්ත්‍රාත්වරයා විසින් පිළිගත හැකි වූ සියලු සාක්ෂි ද විභාග කිරීමෙන් හා සලකා බැලීමෙන් පසු කළ යුතු ය :

එසේ වුව ද, ඉඩමේ හෝ ඉඩමෙහි කොටසේ භුක්තියට යම් තැනැත්තන්ගේ හිමිකම් පෑම්වල සුදුසුකම් නොබලා (1) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ වූ නිශ්චයක් කරනු ලැබිය හැකි ය.

(8) යම් ඉඩමකට බල පාන ආරාවුලක් නිරවුල් කිරීමේ නියමයන් ඒ ආරාවුලට සම්බන්ධ තැනැත්තන් අතර ස්වේච්ඡාවෙන් ගිවිස ගනු ලැබූ හා මහේස්ත්‍රාත්වරයා විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, එසේ තීන්දු කර ගත් නියමයන්ට අනුකූල ව මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන යටතේ වූ ආඥාවක් කළ හැකි ය.

(9) (8) වන උපවගන්තියෙන් විධිවිධාන සැලැස්වුණු අවස්ථාවේදී හැර, මේ වගන්තිය යටතේ වූ ආඥාවක් කළ අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා විසින්, ඒ ආඥාව බල පාන යම් තැනැත්තකු විසින් ඒ සඳහා තමා වෙත කරනු ලැබූ ඉල්ලීමක් පිට, ඒ ආඥාව පරිච්ඡින්න කළ හැකි ය; නැත හොත් අවස්ථානුකූල යැයි තමා විසින් සලකනු ලැබිය හැකි ආකාරයෙන් එය වෙනස් කළ හැකි ය.

(10) මේ පරිච්ඡේදය යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් කරනු ලබන ආඥාවකට විරුද්ධව කිසි ම අභියාචනා කිරීමක් නොවිය යුතු ය.

ආඥාව කඩ කිරීම, හෝ ආඥාව අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම සඳහා දණ්ඩනය.

98ඈ. මේ පරිච්ඡේදය යටතේ කරන ලද ආඥාවක් කඩ කරමින් ක්‍රියා කරන, නැතහොත් ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින, යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස තුනකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පන්සියයක දඩය කට යටත් විය යුතු ය.

සිවිල් නඩුවකදී තහවුරු කරනු ලැබිය හැකි අයිතිවාසිකම් කට හෝ සම්බන්ධතාව කට ආඥාව බල නොපාන බව.

98ඉ. මේ පරිච්ඡේදය යටතේ වූ කිසි ම ආඥාවක් සිවිල් නඩුවකදී යම් තැනැත්තකු විසින් තහවුරු කරනු ලැබිය හැකි යම් ඉඩමක හෝ ඉඩම් කොටසක යම් අයිතිවාසිකමක් හෝ සම්බන්ධතාවක් කෙරෙහි බල නොපෑ යුතු ය; තව ද මේ වගන්තියේ බල පෑම ආරාවුලට සම්බන්ධ තැනැත්තන්ට පැහැදිලි කර දීම මේ පරිච්ඡේදය යටතේ විභාගයක් පැවැත්වීම ආරම්භ කරන මහේස්ත්‍රාත්වරයාගේ යුතුකම විය යුතු ය.

සමගි මණ්ඩල පනතේ 14 වන වගන්තිය අදාළ නොවිය යුතු බව.

98ඍ. 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ විධිවිධාන කෙසේ වුව ද ඒ පනතේ 14 වන වගන්තියේ විධිවිධාන මහෙස්ත්‍රාත් අධිකරණයක මේ පරිච්ඡේදය යටතේ පැවැත්වෙන යම් නීති කෘත්‍යයක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

" ඉඩම්වලට බල පාන ආරාවුල " යන්නෙහි අර්ථය.

98ඏ. මේ පරිච්ඡේදයෙහි " ඉඩම්වලට බල පාන ආරාවුල " යන්නට යම් ඉඩමක හෝ ඉඩමක යම් කොටසක භුක්තියේ අයිතිවාසිකම පිළිබඳ ඒ ඉඩමේ හෝ කොටසේ මායිම් පිළිබඳ හෝ යම් ඉඩමක් හෝ ඉඩමක යම් කොටසක් වගා කිරීමේ අයිතිවාසිකම පිළිබඳ හෝ යම් ඉඩමක හෝ ඉඩම් කොටසක අස්වැන්නට හෝ පලදාවට ඇති අයිතිවාසිකම පිළිබඳ හෝ ඉඩමට බල පාන පරවශතාවක ස්වභාවයේ යම් අයිතිවාසිකමක් පිළිබඳ යම් ආරාවුලක් ඇතුළත් වේ. '.

XXVඅ වන අලුත් පරිච්ඡේදය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ XXV වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියෙහි XXVඅ වන පරිච්ඡේදය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

'XXVඅ වන පරිච්ඡේදය

අත්හිටවූ දණ්ඩන නියම

අත්හිටවූ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියම.

324අ. (1) වරදක් සඳහා වරදකරුවකුට අවුරුදු දෙකකට නොවැඩි කාලයක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කරන අධිකරණයක් විසින්, ආඥාවෙහි නිශ්චිත ව සඳහන් වන, ඒ ආඥාවේ දින සිට අවුරුදු පහකට නොඅඩු වූ (මෙහි මින් මතු " ක්‍රියාත්මක වීමේ කාල සීමාව " යනුවෙන් සඳහන් කරනු ලබන) කාල සීමාවක් තුළ ඒ වරදකරු විසින් (මේ පරිච්ඡේදයෙහි මින් මතු " තදනන්තර වරද " යනුවෙන් සඳහන් කරනු ලබන) බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වෙනත් වරදක් කරනු ලැබුවහොත් මිස, ඒ දණ්ඩන නියමය ක්‍රියාත්මක නොවිය යුතු යැයි ආඥා කළ හැකි ය.

(2) බන්ධනාගාරගත කිරීමේ අත්දැකීමක් කලින් ලැබ නොමැති වරදකරුවකුට එක් වරදක් සඳහා මාස හයකට නොවැඩි කාලයක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කරන අධිකරණයක් විසින්—

(අ) සාහසික ක්‍රියාවක් කිරීම නොහොත් කිරීමට තර්ජනය කිරීම, හෝ තුවක්කුවක්, පුපුරණ ද්‍රව්‍යයක් හෝ පීඩාකර ආයුධයක් පාවිච්චි කිරීම නොහොත් සන්තකයෙහි තබා ගැනීම වරදට සම්බන්ධ නම් මිස ;

(ආ) ඒ වරද පරිවාස ආඥාවක් හෝ කොන්දේසි සහිත නිදහස් කිරීමේ ආඥාවක් කලින් කරනු ලැබීමට සම්බන්ධ වූවක් නම් මිස ; නැතහොත්

(ඇ) ඒ වරද කරන අවස්ථාවේදී ඒ වරදකරු අත්හිටවූ දණ්ඩන නියමයකට යටත්ව සිටියේ නම් මිස

(1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කළ යුතු ය.

(3) එක් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට අත්හිටවූ දණ්ඩන නියමයක් කරන අධිකරණයක් විසින් ඒ නීති කෘත්‍යයෙහිදී ම ඊට වෙනස් වරදක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් නොපැනවිය යුතු ය.

(4) අත්හිටවූ දණ්ඩන නියමයක් කරනු ලැබූ විට, ක්‍රියාත්මක වීමේ කාල සීමාව තුළ වරදකරු විසින් තදනන්තර වරදක් කරනු ලැබුවහොත් 324ආ වන වගන්තිය යටතේ ඔහුගේ බැඳීම් අධිකරණය විසින් සාමාන්‍ය භාෂාවෙන් ඔහුට පැහැදිලි කර දිය යුතු ය.

(5) ක්‍රියාත්මක වීමේ කාල සීමාව තුළ තදනන්තර වරදක් වරදකරු විසින් කරනු නොලැබුවහොත්, ඒ වරදට පනවන ලද අත්හිටවූ දණ්ඩන නියමය කිසි කලෙකත් නොපැනවූ ලෙස සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු ය.

(6) යම් අධිකරණයක් විසින් මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ අත්හිටවූ දණ්ඩන නියමයක් පනවනු ලැබීමට පෙර, ඒ වරදකරු හඳුනා ගැනීම ද ඔහුගේ ඇඟිලි සටහන් ගැනීම ද සඳහා වූ ආඥාවක් අධිකරණය විසින් කළ යුතු ය.

තදනන්තර වරදට වරදකරු කළ විට අත්හිටවූ දණ්ඩන නියමය ගැන ක්‍රියා කිරීමට අධිකරණයට ඇති බලය.

324ආ. (1) ක්‍රියාත්මක වීමේ කාල සීමාව ඇතුළත වරදකරු විසින් කරන ලද තදනන්තර වරදකට ඔහු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, ඔහු එසේ වරදකරු කරන අධිකරණය විසින් වහා ම හෝ ඒ අධිකරණය විසින් තදනන්තර වරද සම්බන්ධයෙන් පනවනු ලැබිය හැකි බන්ධනාගාර ගත කිරීමේ කාලයක් ගත වූ විට, අත්හිටවූ දණ්ඩන නියමය ක්‍රියාත්මක විය යුතු යැයි ආඥා කළ යුතු ය :

එසේ වුව ද, උචිත නඩුවකදී, සැහැල්ලු කරන කරුණු කිසිවක් යටතේ තදනන්තර වරද කර තිබේ නම්, ඒ කරුණු හෝ ඒ වරදෙහි සුළු බව සැලකිල්ලට ගෙන, අධිකරණය විසින්,—

(අ) මුලින් නියම කරන ලද දණ්ඩන කාලය වෙනුවට ඊට කෙටි කාලයක් ආදේශ කොට ඒ අත්හිටවූ දණ්ඩන නියමය ක්‍රියාත්මක විය යුතු යැයි ආඥා කළ හැකි ය;

(ආ) 324අ වන වගන්තියෙහි (1) වන උප වගන්තිය යටතේ වූ කලින් කරන ලද ආඥාව, එහි නිශ්චිතව සඳහන් ක්‍රියාත්මක වීමේ කාල සීමාව වෙනුවට, වෙනස් කිරීමේ දින සිට අවුරුදු පහකට පසු නොවී ඉකුත් වන ක්‍රියාත්මක වීමේ කාල සීමාවක් ආදේශ කිරීමෙන් ආඥාවක් මගින් වෙනස් කළ හැකි ය; නැතහොත්

(ඇ) අත්හිටවූ දණ්ඩන නියමය පිළිබඳව කිසිදු ආඥාවක් නොකර සිටිය හැකි ය;

තව ද අධිකරණය (අ), (ආ) හෝ (ඇ) යන ඡේද යටතේ ක්‍රියා කරන සෑම අවස්ථාවක ම ඊට හේතු ඒ අධිකරණය විසින් ප්‍රකාශ කළ යුතු ය.

(2) වෙනත් අධිකරණයක් විසින් පනවන ලද අත්හිටවූ දණ්ඩන නියමයක් සම්බන්ධයෙන් වරද කරුවකු ගැන මේ වගන්තිය යටතේ අධිකරණයක් ක්‍රියා කරන අවස්ථාවක, ඒ වරදකරු පිළිබඳව ක්‍රියා කළ ආකාරය ඒ වරදකරු ගැන ක්‍රියා කරන අධිකරණය විසින් ඒ දණ්ඩන නියමය පැනවූ අධිකරණය වෙත නිවේදනය කළ යුතු ය.

(3) අත්හිටවූ දණ්ඩන නියමයක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක්, යම් අභියාචනයක් ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, අත්හිටවූ දණ්ඩන නියමය මුලින් පනවනු ලැබූ වරද සඳහා ඒ අධිකරණය විසින් ඒ වරදකරු වෙත පනවන ලද දණ්ඩන නියමයක් ලෙස සැලකිය යුතු ය.

තවදුරටත් වූ වැරදි එළිදරව් කිරීම.

324ඇ. (1) අත්හිටවූ දණ්ඩන නියමයක් ක්‍රියාත්මක වීමේ කාල සීමාව තුළ යම් අධිකරණයක් විසින් තදනන්තර වරදක් සඳහා වරදකරුවකු වරදකරු කරනු ලැබූයේ වී නමුදු ඒ අත්හිටවූ දණ්ඩන නියමය ඒ අධිකරණය නොදන්නා බැවින් ඒ දණ්ඩන නියමය සම්බන්ධයෙන් ඒ අධිකරණය වරදකරු ගැන ක්‍රියා නොකරන අවස්ථාවක, ඒ

අත්හිටවූ දණ්ඩන නියමය හා තදනන්තර වරදට වරදකරු කරනු ලැබීම සම්බන්ධයෙන් තොරතුරු ලැබුණු විට, යම් අධිකරණයක් විසින්, සිතාසියෙහි නිශ්චිතව සඳහන් ස්ථානයේදී හා වේලාවේදී පැමිණ සිටින ලෙස ඒ වරදකරුට නියම කරමින් සිතාසියක් නිකුත් කළ හැකි ය; නැතහොත් ඔහු සිර භාරයට ගැනීම සඳහා වරෙන්තුවක් නිකුත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සිතාසියකින් හෝ වරෙන්තුවකින්, වරද කරුට ඔහු තදනන්තර වරද සම්බන්ධයෙන් වරද කරු කළ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙස හෝ ඔහු ඒ අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස නියම විය යුතු අතර, ඒ වරදකරු එහි පෙනී සිටි කල්හි නැතහොත් එසේ ගෙන එනු ලැබූ කල්හි, අධිකරණය විසින්, ඒ අත්හිටවූ දණ්ඩන නියමය සම්බන්ධයෙන් 324ආ වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඔහු ගැන ක්‍රියා කිරීම ආරම්භ කළ යුතු ය.'.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ XXXV වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ XXXVඅ වන පරිච්ඡේදය වශයෙන් බල පැවැත්විය යුතු ය:— XXXVඅ වන අලුත් පරිච්ඡේදය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

'XXXVඅ වන පරිච්ඡේදය

**රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂ, ඔහුගේ බලතල හා යුතුකම්**

රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂ, ඔහුගේ බලතල හා යුතුකම්.

393අ. (1) (මේ පරිච්ඡේදයෙහි මින් මතු "අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලබන) රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂ යැයි කියනු ලබන හා හඳුන්වනු ලබන නිලධරයකු නීතිපති දෙපාර්තමේන්තුවෙහි සිටිය යුතු ය.

(2) මේ සංග්‍රහය හෝ අන් කිසි නීතියක් යටතේ වූ ඒ අධ්‍යක්ෂගේ බලතල හා යුතුකම් ක්‍රියාවෙහි යෙදවීමේදී සහ ඉටු කිරීමේදී, ඔහුට සහාය වීම පිණිස නීතිපති විසින් යොදවනු ලැබිය හැකි නිලධරයන් ඒ අධ්‍යක්ෂහට සහාය විය යුතු ය.

(3) මේ සංග්‍රහය හෝ අන් කිසි ලිඛිත නීතියක් යටතේ වූ ස්වකීය බලතල හා යුතුකම් ක්‍රියාවෙහි යෙදවීමේදී හා ඉටු කිරීමේදී නීතිපතිගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට අධ්‍යක්ෂ යටත් විය යුතු ය.

(4) සාපරාධි වැරදි සඳහා යම් අධිකරණයක නඩු පැවරීම් පිළිබඳ කරුණුවලදී, නිවර්තන ආඥාවක් පැනවීමේ හෝ අපරාධ සහායකයකුට සමාව දීමේ හෝ නිදොස් කිරීමකට විරුද්ධ අභියාචනයක් අනුමත කිරීමේ හෝ 290(2) වන වගන්තිය යටතේ වරදක් සමථයකට පත් කිරීමේ බලය හැර යම් ලිඛිත නීතියක් යටතේ වූ නීතිපතිගේ සියලු බල තල අධ්‍යක්ෂ විසින් ක්‍රියාවෙහි යෙදවිය හැකි ය.

(5) (අ) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ලඝු ලෙස නඩු විභාග කළ නොහැක්කාවූත් මහෙස්ත්‍රාත්වරයකු විසින් 152 (3) වන වගන්තිය යටතේ නීති කෘත්‍ය ආරම්භ කොට නැත්තාවූත් යම් වරදක් සම්බන්ධයෙන් ද ;

(ආ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රජයේ සංස්ථාවක් විසින් තමා වෙත යොමු කරනු ලැබූ හා අපරාධ නීති කෘත්‍ය ආරම්භ කළ යුතු යැයි තමා අදහස් කරන යම් කරුණකදී ; හා

(ඇ) තමාගේ මැදිහත් වීම අවශ්‍ය යැයි යම් හේතුවක් නිසා තමාට පෙනී යන යම් කරුණකදී ද

නීතිපති වෙනුවෙන් බලතල ක්‍රියාවෙහි යෙදවීම අධ්‍යක්ෂගේ යුතුකම විය යුතු ය.

(6) යම් අපරාධ නීති කෘත්‍යයක් යම් තැනැත්තකු විසින් පැවරීමට හෝ පවත්වා ගෙන යාමට මේ සංග්‍රහයේ අන් කිසි වගන්තියකින් බලය දී තිබේ නම් හෝ අවසර දී තිබේ නම් ඒ නීති කෘත්‍යය පැවරීමෙන් හෝ පවත්වා ගෙන යාමෙන් මේ වගන්තියෙහි ඉහත දැක්වුණු විධිවිධානවල කිසිවකින් ඒ තැනැත්තා වැළැක්වීමක් සිදු නොවිය යුතු ය ; එහෙත් ඒ නීති කෘත්‍යය පවත්වාගෙන යාම තමා විසින් කිරීම සුදුසු යැයි අධ්‍යක්ෂ අදහස් කරනහොත් ස්වකීය පරම අභිමතය අනුව ඔහු විසින් ඒ නීති කෘත්‍යයේ යම් අවස්ථාවකදී එය පවත්වාගෙන යාම භාර ගත හැකි ය.

අපරාධ කරුණු සම්බන්ධයෙන් උපදෙස් දීම.

393ආ. (1) ඉල්ලීමක් කරනු ලැබූ විට හෝ තමාගේ ම කැමැත්ත පිට යම් අපරාධ කරුණකදී පොලිසියට සහ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ රජයේ සංස්ථාවකට හෝ සුදුසු යැයි තමා අදහස් කරන අන් කිසි තැනැත්තකුට අධ්‍යක්ෂ විසින් උපදෙස් දිය හැකි අතර ඒ උපදෙස් ස්වකීය අභිමතය අනුව වාචික ව හෝ ලිඛිත ව දිය හැකි ය.

(2) අපරාධ නඩුවක් පවත්වා ගෙන යෑමේදී ස්වකීය නියෝජිතයා වශයෙන් ක්‍රියා කිරීම පිණිස, තමාට සහාය වීම සඳහා යොදවනු ලැබූ නිලධරයකු නොවන උත්තරවාදියකුට අධ්‍යක්ෂ විසින් බලය පවරනු ලැබිය හැකි අතර එසේ බලය පවරනු ලැබූ උත්තරවාදින්ට ගෙවිය යුතු ගාස්තු ඔහු විසින් නිශ්චය කළ හැකි ය.

(3) යම් අපරාධ නීති කෘත්‍යයක් නිසි ලෙස පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍යයෙන් ම දරන ලද බවට තමා හැඟීමට පත් වුවහොත් විශේෂ වියදම් කිසිවක් ගෙවීමට බලය දෙමින් අධ්‍යක්ෂ විසින් අපරාධ නඩුවකට සහාය විය හැකි ය.

අධ්‍යක්ෂ වෙත එවිය යුතු පොලිස් වාර්තා.

393ඇ. යම් ප්‍රදේශයක් තුළ කරන ලදැයි කියනු ලබන වැරදි සම්බන්ධයෙන් ඒ ප්‍රදේශය භාර පොලිස් අධිකාරි හෝ සහකාර පොලිස් අධිකාරි විසින්,—

(අ) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ලඝු ලෙස නඩු විභාග කළ නොහැකි සෑම වරදක් ද;

(ආ) නීතිපති විසින් හෝ ඔහුගේ කැමැත්ත හෝ අනුමතිය ඇති ව නඩු පැවරීමට නීතියෙන් නියමිත සෑම වරදක් ද;

(ඇ) නඩුව ඉල්ලා අස්කර ගත් නැතහොත් යුක්ති සහගත කාලයක් ඇතුළත නඩුව පවත්වා ගෙන යෑම නොකළ සෑම සංජ්ඥේය වරදක් ද;

(ඈ) අධ්‍යක්ෂ විසින් තොරතුරු ඉල්ලා ඇති සෑම කරුණක් ද;

(ඉ) අධ්‍යක්ෂගේ උපදෙස් හෝ සහාය ලබා ගැනීම යෝග්‍ය බව ඒ අධිකාරිහට හෝ සහකාර අධිකාරිහට පෙනී යන සෑම කරුණක් ද;

(ඊ) මේ වගන්තිය යටතේ වාර්තාවක් අවශ්‍ය වරදක් යැයි ආඥාවක් මගින් නීතිපති විසින් නිශ්චය කරනු ලැබූ අන් කිසි වරදක් පිළිබඳ සෑම කරුණක් ද

හැකි තාක් ඉක්මණින් අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතු ය.

පොලිස් වාර්තා ඉදිරිපත් කිරීමේදී සැපයිය යුතු තොරතුරු.

393ඈ. ඉහත දැක්වුණු වගන්තියේ නියමයන් අනුව වාර්තා කිරීමේදී, අවස්ථාවෝචිත පරිදි, පොලිස් අධිකාරි නැතහොත් සහකාර පොලිස් අධිකාරි විසින්—

(අ) එළඹ පැවති තත්ත්වයන් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ;

(ආ) සියලු ම සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශවල පිටපත් ;

(ඇ) වරද සම්බන්ධයෙන් යම් අධිකරණ නිලධරයකු, සාමදාන විනිශ්චයකරුවකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරයකු හෝ විභාග කරන්නකු ඉදිරිපිට පවත්වන ලද යම් නීති කෘත්‍යයක් වී නම් එහි වාර්තාවක් : සහ

(ඈ) අදාළ විය හැකි නොහොත් සපයන ලෙස අධ්‍යක්ෂ විසින් නියම කළ හැකි වෙනත් තොරතුරු, ලේඛන හෝ ඉදිරිපත් කළ යුතු දේවල්

අධ්‍යක්ෂ වෙත සැපයිය යුතු ය.

අධ්‍යක්ෂගේ බලතල සහ යුතුකම් පිළිබඳ නියෝග.

393ඉ. (1) මේ පරිච්ඡේදය යටතේ වූ අධ්‍යක්ෂගේ බලතල සහ යුතුකම් ක්‍රියාවෙහි යෙදවීමට සහ ඉටු කිරීමට ඔහුට හැකි වීම පිණිස අවශ්‍ය විය හැකි සියලු ආනුෂංගික හෝ පරිපූරක විධිවිධාන ඇතුළත් නියෝග අමාත්‍යවරයා විසින් පැනවිය හැකි ය.

(2) එසේ පනවනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයෙහි එය ක්‍රියාත්මක විය යුතු ය; තව ද එබඳු සෑම නියෝගයක් ම ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර අනුමත කරනු නො ලැබී නම් මිස එය නොකඩ ව බල පැවැත්විය යුතු ය.

නීතිපතිගේ බලතල වෙනුවෙන් අත් හැරීම.

393ඊ. මේ පරිච්ඡේදයෙහි කිසිවක් මේ සංග්‍රහය හෝ අන් කිසි නීතියක් යටතේ වූ නීතිපතිගේ බලතලවල සහ කාර්යයන්හි බලහීන කිරීම් වශයෙන් යැයි හෝ ඒ බලතල හෝ කාර්යයන් සීමා කිරීම් වශයෙන් යැයි තේරුම් නොගත යුතු ය.

අර්ථ නිරූපණය.

393උ. විෂයයෙන් හෝ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් පෙනී යනහොත් මිස, මේ පරිච්ඡේදයෙහි "රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂ" යන්නට වැඩ බලන රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂ කෙනකු සහ රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂට සහාය වීම පිණිස යොදවනු ලැබ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන යම් නිලධරයෙක් ඇතුළත් වෙති.'.